තේ තතු
2011 ජුනි
වෙළුම 8 කාණ්ඩය 1
ISSN-1391-6785 ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි.

# පහතරට තේ වගාවට වැලඳුනු ඇල්ගා රෝගය

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ඇතැම් තේ ඉඩම් වල පසුගිය කාලයේදී හඳුනානොගත් රෝගී තත්වයක් පැතිරයමින් පැවති බව වාර්තා විය. මෙම තත්වය ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක වල, සාපේක්ෂව අඩු උච්චත්වයක් ඇති ප්‍රදේශවලින් වාර්තා විය.

මාතර දිස්ත්‍රික්කයේ කළුබෝවිටියන ප්‍රදේශයේ ඇතැම් තේ වගාවන් වල මෙම රෝගී තත්වය නිරීක්ෂණය කළ කුඩා තේ වතු හිමියන් එම ප්‍රදේශයේ තේ පරීක්ෂක නිලධාරී වරයා හරහා උක්ත කරුණ පිළිබඳව ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ දෙනියාය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ අවධානය යොමු කරන ලද අතර ඒ අනුව අප විසින් මේ පිළිබඳ වූ පර්යේෂණ කටයුතු අරඹන ලදි.

මෙම රෝගී තත්වය තේ පඳුරු වල මේරූ පත්‍ර (නඩත්තු පත්‍ර) මත ඇතිවී තිබෙනු දක්නා ලද අතර මෙහිදී මූලිකවම මේරූ පත්‍ර මතුපිට " මළකඩ රතු පැහැය " වන් පැහැයක් නිරීක්ෂණය කරන ලදි. ප්‍රධාන වශයෙන්ම වනාන්තර ආශ්‍රිතව පවතින තේ ඉඩම් වල මෙම තත්වය බහුලවම දැකගත හැකි වූ අතර තේ වලට අමතරව වනාන්තර ආශ්‍රිතව වැඩෙන කිතුල්, පුවක්, බට ශාක හා මීවන ශාක වලද මෙය නිරීක්ෂණය කරන ලදි. තවද ගාල්ල දිස්ත්‍රික්කය තුළ කටු පොල් (ඔයිල් ෆාම්) වගාවන් වලද මීට සමාන රෝගී තත්වයක් වාර්තා වී ඇත.



මෙම රෝගී තත්වයට හේතුව පත්‍ර මත වර්ධනය වන ඇල්ගී විශේෂයක් බව මේ සම්බන්ධව කරන ලද මූලික පරීක්ෂණ වලදී අනාවරණය විය. තවද මෙම ඇල්ගී විශේෂ(ය) වනාන්තර වල සිට ඒ ආශ්‍රිතව ඇති තේ ඉඩම් වලට පැතිරී යන බවද අධික වර්ෂාව හා සෙවණ තත්වයන් යටතේදී සීග්‍රයෙන් ව්‍යාප්ත වීමේ වැඩි ඉඩකඩක් පවතින බවද හෙළ විය.

ඒ අනුව සෙල්සියස් $22^0$ කට වැඩි උෂ්ණත්වය, නිරන්තර වර්ෂාපතනය, ඉහළ ආර්ද්‍රතාවය, දුර්වල ජලවහන තත්ව ධාරක ශාකයේ දිරිය වැනි සාධක රෝගය පැතිරීම සඳහා ඉවහල් වන බව සොයා ගෙන ඇත.

තේ පඳුරේ පරිණත පත්‍ර මත ඇතිවන මෙම ඇල්ගී නිසා එම පත්‍ර මතට නිසි පරිදි සූර්යාලෝකය නොලැබී යාමෙන් පත්‍ර වල ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය (ආහාර නිෂ්පාදනය) අඩාල කිරීමේ භෞතික බාධකයක් නිර්මාණය වන අතර එමගින් තේ පඳුරේ වර්ධනයට යම් අහිතකර තත්වයක් ඇතිවීමේ අවදානමක් ඇති බව පෙනේ.

මේ පිළිබඳව වැඩිදුර පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා කළුබෝවිටියන ප්‍රදේශයේ කොණ්ඩගුලන්කන්ද වනය ආශ්‍රිතව පිහිටි මෙම රෝගී තත්වයට දැඩි ලෙස ගොදුරු වූ තේ ඉඩමක් තෝරා ගන්නා ලදි. ඉඩමේ තේ පඳුරු හතළිහක් බැගින් කොටු (Plots) තුනක් වෙන් කරගන්නා ලද අතර එම එක් එක් කොටුවල තේ පඳුරු වල ඇති, රෝගයට පාත්‍ර වූ පත්‍ර සංඛ්‍යාවේ සාමාන්‍ය අගය ගණනය කරගන්නා ලදි. රෝගය පාලනය සඳහා දිලීර නාශක වර්ග 2 ක ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි අත්හදා බලන ලදි.

- ❒ කොටු අංක 1 (plot no.1): තඹ (කොපර් ඔක්සි ක්ලෝරයිඩ් / CuOCl) අඩංගු දිලීර නාශකයකින් ග්‍රෑම් 30 ක් ජලය ලීටර් 16 ක මිශ්‍රකර පත්‍ර හොඳින් තෙමී යන පරිදි නැප්සැක් ඉසිනයකින් යෙදීම. (නැවත යෙදීම සති 3 කට පසුව)
- ❒ කොටු අංක 2 (plot no.2): ගෙන්දගම් (සල්ෆර්) අඩංගු දිලීර නාශකයකින් ග්‍රෑම් 80 ක් ජලය ලීටර් 16 ක මිශ්‍රකර පත්‍ර හොඳින් තෙමී යන පරිදි නැප්සැක් ඉසිනයකින් යෙදීම. (නැවත යෙදීම සති 3 කට පසුව)
- ❒ කොටු අංක 3 (plot no.3): කිසිදු ප්‍රතිකාරකයක් නොයොදා පාලකයක් ලෙස තබන ලදි.

මාසයකට පසුව එක් එක් කොටසේ ඇති පඳුරු වල රෝගී වූ පත්‍ර ප්‍රමාණය ඉහත පරිදිම නැවත වරක් ගණනය කර ගන්නා ලදි. දිලීර නාශක යෙදීමට පෙර හා යෙදූ පසුව ලබාගත් මෙම අගයන් විශ්ලේෂණය කිරීමෙන් පහත සඳහන් කරුණු අනාවරණය කර ගැනීමට හැකි විය.

- ❒ දිලීර නාශක දෙවර්ගය මගින්ම රෝගය පාලනය සඳහා සාර්ථක ප්‍රතිචාර දක්වා ඇති බව.
- ❒ තඹ අඩංගු දිලීර නාශකය, අනෙක් දිලීර නාශකයට වඩා සාර්ථක ලෙස ප්‍රතිචාර දක්වා ඇති බව.

එබැවින් කරුණු සියල්ලම සැලකිල්ලට ගෙන තේ වගාවේ ඇති වී තිබෙන මෙම ඇල්ගා උවදුර පාලනය කිරීම සඳහා තඹ අඩංගු දිලීර නාශකයක් යෙදීම මගින් වඩා සාර්ථක ප්‍රතිඵල ලද හැකි බව පෙනේ. දැනට අනාවරණය වී ඇති තොරතුරු මත මෙම ඇල්ගාව Cephaleuros virescence හෝ (parasiticus බවට විශ්වාස කෙරේ. තවද මෙම ඇල්ගාව ලයිකන තත්වයක් (ඇල්ගා හා දිලීර අතර සහ ජීවන තත්වයක්) දක්වා වර්ධනය වීම හැකි බවට සාධක ඇත.

මේ සම්බන්ධ පර්යේෂණ කටයුතු තව දුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

සී. ඊ. මුණසිංහ